GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 011 2580886/ 0718552552 Fax : 011 2503586
Email : office@gmoa.lk Web : www.gmoa.lk

A CENTURY OF HEALING THE NATION
1926 - 2026
GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

2026.10.23

මාධ්‍ය නිවේදනය

ඉදිරි අයවැය යෝජනා, සෞඛ්‍ය සේවයේ ගැටලු සහ වෘත්තිය ක්‍රියාමාර්ග පිලිබඳ මධ්‍යම කාරක සභා තීරණ දැනුම් දීම.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය සේවය ජාත්‍යන්තරය තුල පවා ප්‍රසාදයට ලක් ව ඇත්තේ හුදෙක්ම සෞඛ්‍ය දර්ශක ඉහළ මට්ටමක පැවතීම පමණක්ම නොව, එම සෞඛ්‍ය දර්ශක සංවර්ධිත රට වල සෞඛ්‍ය දර්ශක මට්ටමට ඉතාම අඩු පිරිවැයක් යටතේ ළඟා කරගත් සෞඛ්‍ය පද්ධතියක් ලෙස ය. මෙය බොහෝ අවස්ථා වලදී ජාත්‍යන්තරයේ ආදර්ශමත් (Model) සෞඛ්‍ය පද්ධතියක් ලෙස ඇගයීමට ලක් ව ඇත. මෙවැනි තත්ත්වයකට සෞඛ්‍ය පද්ධතිය නංවාලීමේදී පැවති සහ පවතින රජයන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේදී මෙන්ම ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ද වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර සමස්ත සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය ඉතා අඩු වැටුප් හා වරප්‍රසාද මට්ටම් තුළ ජාතික වගකීමකට උර දෙමින්, පවතින සියලු බාධා මැද හුදු රැකියාවක් වෙනුවට සේවයක් කිරීමේ අරමුණින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම ප්‍රධාන කාරණයකි. මෙහිදී එම කණ්ඩායමට නිවැරදි නායකත්වයක් සහ දැක්මක් ලබාදෙමින් පැවති හා පවතින රජයන්ට සෞඛ්‍ය පද්ධතිය සකස් විය යුතු ආකාරය පිළිබඳව උපදෙස් දෙමින් තම වෘත්තීය කාර්යභාරයට එහා ගිය ජාතික කාර්යයකට විශේෂඥ වෛද්‍යවරු, පරිපාලන වෛද්‍යවරු සහ ශ්‍රේණි වෛද්‍යවරු උරදෙමින් සිටි.

එහෙත් මේ වන විට වෛද්‍යවරුන් රට තුල රඳවා ගැනීම අභියෝගයක්ව පවති. ඊට ප්‍රධාන හේතුව වෛද්‍යවරුන්ගේ දීමනා කප්පාදුව, සේවයට නිසි වැටුපක් නොලැබීම, අනෙක් රට වල වෛද්‍යවරුන්ට ඇති ඉහළ ඉල්ලුම, නවක වෛද්‍යවරුන්ගේ පත් වීම් වලදි සිදු කරන අනවශ්‍ය දේශපාලන මැදිහත් වීම්, වෛද්‍යවරුන්ගේ මාරු වීම් දේශපාලන වුවමනා එපාකම් මත සිදු කිරීම් සහ අධික බදු වෘත්තීකයන් මත පැනවීම ප්‍රධාන කරුණු වේ.

පසුගිය වසර කිහිපය තුළ රටේ පැවතුනු ආර්ථික අර්බුද හා දේශපාලන අස්ථාවරභාවය තුළ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය එහි සාමාජිකත්වයේ ගැටලු වලට යම් සාධනීය පිළිතුරු ලබා ගැනීමට කටයුතු කළද එවකට පැවති රජයන් හා පවතින රජය රටේ ආර්ථික අස්ථාවරභාවය තුළ යම් කැප කිරීමක් කරමින් කටයුතු කරන ලෙස කරන ලද ඉල්ලීමට ධනාත්මක ප්‍රතිචාරයක් ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කටයුතු කළ අතර මේ වන විට රට ආර්ථික අර්බුදයක නොමැති බවත්, අවශ්‍ය තරමටත් වඩා භාණ්ඩාගාරය ශක්තිමත් බවත් රජය ප්‍රකාශ කරමින් සිටිය ද, එහි ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන පරිදි සෞඛ්‍ය සේවය තුළ වෛද්‍යවරුන් රඳවා ගැනීමට අවශ්‍ය කරන ආර්ථික සාධාරණත්වයක් ඉටු කරන බවක් පෙනෙන්නට නොමැත.

දිගින් දිගටම 2024 වර්ෂයේ අදියර තුනකින් සමස්ත රාජ්‍ය සේවටම සිදු කළ වැටුප් වැඩි කිරීම සම්බන්ධව හා වෛද්‍යවරුන්ට ලැබෙන වැටුප් හා දීමනා සම්බන්ධව වැරදි තොරතුරු සමාජගත කිරීමෙන් වෛද්‍යවරුන්ගේ ප්‍රශ්ණ වලට විසඳුම් දෙනවා වෙනුවට වෛද්‍යවරුන් සම්බන්ධයෙන් සමාජ වෛරයක් ඇති කරමින් සිටින බවක් පෙනෙන්නට තිබේ. මේ ආකාරයට කප්පාදු කළ දීමනා තවදුරටත් ලබානොදෙමින් බුද්ධි ගලනයේ ප්‍රධාන කාණ්ඩයක් වන වෛද්‍යවරුන් මත අධික බදු පටවමින් ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය අර්බුදයකට ඇද දමමින් නවක වෛද්‍යවරුන් ස්ථාන ගත කිරීම හා මාරුවීම් දේශපාලනීකරණය කරමින් ගෙන යන වැඩපිළිවෙල අප සංගමයේ සාමාජිකත්වයේ දැඩි අවධානයට යොමු වී ඇති අතර, මේ හරහා වෘත්තීය ගරුත්වය විනාශ කිරීමට රජය විසින් ගෙන යන සංවිධානාත්මක වෛරී සහගත වැඩපිළිවෙල සාකච්ඡාවට භාජනය වී ඇත.

පවතින ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීමේ අරමුණින් සෞඛ්‍ය අමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා සමඟ අප ඉදිරිපත් කල අයවැය යෝජනා සම්බන්ධව සාකච්ඡා කිරීමට අවස්ථා ගණනාවක් ඉල්ලීම් කර තිබුන ද මේ වන තුරු ඒ සම්බන්ධව සාධනීය සාකච්ඡාවක් ලබා දීමට නොහැකි වීම තුලින් සාකච්ඡාවෙන් ප්‍රශ්ණ විසඳා ගැනීමට උත්සාහ දරන සංගමයක් ලෙස රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය දැඩි කලකිරීමට පත්ව ඇත.

මෙවැනි තත්ත්වයක් තුල වෘත්තීය අයිතිවාසිකම් ලබා දෙනවා වෙනුවට වෛද්‍ය ස්ථානමාරු වීම, වෛද්‍ය පත්වීම් ලබා දීම දේශපාලනිකරණය කරමින් කටයුතු කරන රජය අසාධාරණයට එරෙහිව පෙනී සිටින වෘත්තීය සමිති මර්දනය කිරීම සඳහා ප්‍රතිත්‍රස්ත පනත වෙනත් නමකින් (ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත - PSTA) සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත හරහා අධිකරණයේ ස්වාධිනත්වයට මැදිහත් වීම හරහා මර්ධනකාරී වැඩපිළිවෙලකට සුදානම් වන බව පෙනෙන්ට තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුල කටයුතු කරන සංගමයක් ලෙස අයිතිවාසිකම් කප්පාදුවට එරෙහිව සහ වෛද්‍යවරුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ඕනෑම මර්දනයක් හමුවේ සුදානම් වෘත්තීය සමිතියක් ලෙස මේ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කාලය එළඹ ඇති බව රජය සාකච්ඡාවක්වත් නොදී ගෙන යන වැඩපිළිවෙල හරහා පැහැදිලි වී ඇත.

මේ වන විට ඉදිරි අයවැයෙන් ප්‍රධාන කාණ්ඩ 5 කට අනුකූලව ප්‍රධාන ඉල්ලීම් 20 කින් යුත් යෝජනාවලියක් රජය වෙත ඉදිරිපත් කර ඇත.

1. වෛද්‍යවරුන් රට තුල රඳවා ගැනීම සඳහා සහ සාධාරණ වැටුපක් සඳහා වූ යෝජනා.
2. රාජකාරිය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පහසුකම් සහ අනිකුත් අවශ්‍යතා සහ දීමනා.
3. වෘත්තීකයන් සඳහා වූ බදු සංශෝධන යෝජනා.
4. දැනුම මූලික ආර්ථිකයක් සඳහා සහ සෞඛ්‍ය සේවය මඟින් විදේශ විනිමය ඉපයීම සඳහා වූ යෝජනා.
5. විශේෂඥ වෛද්‍යවරුන්, පරිපාලන වෛද්‍යවරුන් සහ ශ්‍රේණි වෛද්‍යවරුන් සඳහා වූ විශේෂිත අවශ්‍යතා.

මෙම කරුණු සම්බන්ධයෙන් අද දින පැවති මධ්‍යම කාරක සභාවේදි දීර්ඝ ලෙස සාකච්ඡාවට ගැණුනු අතර ඉදිරි සති දෙකක කාලය තුලදි ඉහත කරුණු සම්බන්ධව වෛද්‍යවරුන්ගේ විරෝධතාවය රට පුරා විහිදෙන පරිදි ප්‍රකාශ කිරීමට අවශ්‍ය තිරණ ගන්නා ලදී.

ස්තූතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය යු. කේ. බී. වරකාගොඩ,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

වෛද්‍ය ලසිත ධම්මික (මාධ්‍ය ප්‍රකාශක)	-	0777611420
වෛද්‍ය ප්‍රභාත් සුගතදාස	-	0714471066
වෛද්‍ය පාලිත රාජපක්ෂ	-	0718480300
වෛද්‍ය චමිල් විජේසිංහ	-	0717080041
වෛද්‍ය හංසමාල් වීරසුරිය	-	0776549339
වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ	-	0716812160
වෛද්‍ය ආර්. තනිගවාසන්	-	0772369608
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ	-	0777829001
වෛද්‍ය අජන්ත රාජකරුණා	-	0766736296
වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ	-	0714410467
වෛද්‍ය අන්ෆාස් ෆාරූක්	-	0771115117
වෛද්‍ය සංජීව තල්ගහගොඩ	-	0716173330